සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# මහජන බැංකුවේ සහකාර කළමනාකාර (3-III) ශ්‍රේණියට උසස් කිරීම සඳහා ලිඛිත විභාගය - 2016

## (01) පළමුවන ප්‍රශ්න පත්‍රය

පැය එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **08** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 6 | |
| 3 | 7 - 15 | |
| 4 | 16 - 23 | |
| 5 | 24 - 31 | |
| 6 | 32 - 40 | |
| 7 | 41 - 46 | |
| 8 | 47 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

● අංක 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. චෙක්පත් ලිවීමේ දී 'සාධාරණ සැලකිල්ලක් දැක්වීම' යන්නෙන් අදහස් වන්නේ
   (1) අණකරුගේ ලිඛිත අණ ක්‍රියාත්මක කිරීමේ දී බැංකුව නොමග නොයන පරිදි සහ වංචා වැළැක්වෙන පරිදි සාධාරණ සැලකිල්ලෙන් යුතුව කටයුතු කිරීමයි.
   (2) අණකරුගේ ලිඛිත අණ ක්‍රියාත්මක කිරීමේ දී ආදායකයා (Payee) නොමග නොයන පරිදි සාධාරණ සැලකිල්ලෙන් යුතුව කටයුතු කිරීමයි.
   (3) චෙක්පත් අත්සන් කිරීමේ දී හා රේඛනය කිරීමේ දී සාධාරණ සැලකිල්ලක් දැක්වීමයි.
   (4) චෙක්පත් ආදායකයා අතට පත්කිරීමේ දී සාධාරණ සැලකිල්ලක් දැක්වීමයි. (.........)

2. 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වන වගන්තිය අනුව රහස්‍යතාව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බැංකු සේවකයන් බැඳී සිටියි. මෙම වගන්තියට අනුව ගනුදෙනුකරුවන්ගේ තොරතුරු හෙළිදරව් කළ නොහැක්කේ
   (1) නීතියෙන් ඉල්ලා සිටි විට උසාවියට ය.
   (2) විගණකට ය.
   (3) රාජකාරි කටයුතු කිරීමේ දී එම බැංකුවේ ම සේවකයකුට ය.
   (4) ගිණුම පවත්වාගෙන යන ගනුදෙනුකරුට ය. (.........)

3. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීම, එවැනි දෑ අනාවරණය කිරීම, විමර්ශනය කිරීම සඳහා පහසුකම් සලසනු පිණිස හා පිළිවෙළින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට එරෙහිව වැරදි සඳහා නඩු පැවරීමට අවශ්‍ය සැකකටයුතු මූල්‍ය ගනුදෙනු පිළිබඳ දත්ත එකතු කිරීම ප්‍රධාන අරමුණක් වන්නේ
   (1) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතෙහි ය.
   (2) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (Convention) පනතෙහි ය.
   (3) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි ය.
   (4) 1988 අංක 30 දරන බැංකු පනතෙහි ය. (.........)

4. නීතිය ක්‍රියාත්මක වීමෙන් බැංකුව හා ගනුදෙනුකරුවා අතර ඇති සම්බන්ධය අවසන් නොවන්නේ පහත කවර අවස්ථාවක දී ද?
   (1) ගනුදෙනුකරුගේ මරණය
   (2) ගනුදෙනුකරුගේ මානසික අපොහොසත් බව
   (3) අන්‍යොන්‍ය එකඟත්වයෙන් ගිවිසුම අවසන් කිරීම
   (4) ගනුදෙනුකරුගේ ඈවර කිරීම (.........)

5. බැංකුවක් චෙක්පත් රැස්කිරීමේ දී එම චෙක්පත් ගනුදෙනුකරුට අයත් නොවූව ද දෝෂ සහිත අයිතියක් තිබුණ ද බැංකුවට විනිමය බිල්පත් ආඥාපනතේ 82 වගන්තියේ රැකවරණය ලැබෙන්නේ
   (1) බැංකුව හොඳ හිතින්, නොසැලකිලිමත්කමින් තොරව, ගනුදෙනුකරු වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් තමා වෙත රේඛිත චෙක්පත්වලට ගෙවීම් ලබා ගනී නම් ය.
   (2) බැංකුව හොඳ හිතින්, ගනුදෙනුකරු වෙනුවෙන් සාමාන්‍යයෙන් තමාවෙත රේඛිත චෙක්පත්වලට ගෙවීම් ලබා ගනී නම් ය.
   (3) බැංකුකරු වටිනාකමේ ධාරක (Holder for value) වන්නේ නම් ය.
   (4) බැංකුකරු යථාකාලීන ධාරක (Holder in due course) වන්නේ නම් ය. (.........)

6. සමහර බැංකු ගනුදෙනුවල දී උපනිධායක (Bailor) උපනිධානලාභී (Bailee) සම්බන්ධතාව පැන නගින අතර එය සාමාන්‍යයෙන් ගිවිසුම්මය සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබේ. මෙම සම්බන්ධතාවෙන් ව්‍යංග වන්නේ
   (1) උපනිධානලාභීට දේපළෙහි සන්තකය හෝ පාලනය ලැබෙන අතර උපනිධායකට එහි අයිතිය හිමි වන බවයි.
   (2) දේපළෙහි අයිතිය සහ සන්තකය යන දෙකම උපනිධායක රඳවා ගන්නා බවයි.
   (3) දේපළෙහි අයිතිය සහ සන්තකය යන දෙකම උපනිධානලාභී රඳවා ගන්නා බවයි.
   (4) උපනිධායක දේපළෙහි සන්තකය රඳවා ගන්නා අතර උපනිධානලාභී අයිතිය ලබා ගන්නා බවයි. (.........)



Department of Examinations Sri Lanka

7. චෙක්පතක ආදායකට (payee) යථාකාලීන ධාරක විය නොහැක්කේ
   (1) මතුපිටින් සම්පූර්ණ හා විධිමත් නොවූ චෙක්පත් ලද ආදායකට
   (2) චෙක්පත කල් ඉකුත් වූ පසු ධාරක බවට පත්වූ ආදායකට
   (3) හොඳහිතින් වටිනාකම ගෙවා චෙක්පත ලබාගෙන නොමැති ආදායකට
   (4) චෙක්පත ආදායකට ගනුදෙනුකර නොමැති විට සහ එය ආදායක වෙත නිකුත් කර පමණක් ඇති විට(.........)

8. 'මුදල් හෝ අණට' නිකුත් කරන ලද
   (1) චෙක්පතක් ඉදිරිපත් කරන ඕනෑම අයෙකුට කවුන්ටරයෙන් ගෙවිය හැකි ය.
   (2) චෙක්පතක් නිෂ්කාෂණය මගින් ලද විට පමණක් භාරගත හැකි ය.
   (3) චෙක්පතක් අණකරුට හෝ ඔහුගේ බැංකුව හඳුනන නියෝජිතට පමණක් කවුන්ටරයෙන් ගෙවිය හැකි ය.
   (4) චෙක්පතකට ගෙවීම් කළ නොහැකි අතර "අවිධිමත්ව ලියා ඇත" යනුවෙන් සටහන් කොට හරවා යැවිය යුතු ය. (.........)

9. තේසවලාමෙයි නීතියට යටත් පුද්ගලයකු මියගිය කළ ඔහුගේ බැංකුවේ ඇති මුදල් දේපළට යටත් වන විට කලත්‍රයා සහ දරුවන්ගේ අයිතිය බෙදී යන්නේ මෙසේ ය.
   (1) අර්ධයක් කලත්‍රයාට හිමි වන අතර ඉතිරි අර්ධය දරුවන් අතර සමව බෙදේ
   (2) කලත්‍රයා සහ දරුවන් අතර සමව බෙදේ
   (3) කලත්‍රයාට සම්පූර්ණ දේපළම අයත් වේ
   (4) කලත්‍රයාට දේපළින් 1/3 ක් හිමිවන අතර ඉතිරිය දරුවන් අතර සමව බෙදේ (.........)

10. තහනම් නියෝගයක් ලැබුණු විට බැංකුව ගත යුතු පළමු පියවර වන්නේ
   (1) තහනම් නියෝගයෙන් දක්වන ලද ගිණුම්වල අනාගත ක්‍රියාකාරිත්වය වහාම නතර කිරීම ය.
   (2) තහනම් නියෝගය ලැබුණු නිශ්චිත වේලාව සහ දිනය වහාම අදාළ පද්ධතිය තුළ සටහන් කර ගැනීම ය.
   (3) නිවේදනයෙහි විස්තර වහාම ගනුදෙනුකරුට දන්වන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දීම ය.
   (4) ගිණුම්වල අනාගත මෙහෙයුම් සඳහා ගනුදෙනුකරුගේ උපදෙස් ලබා ගැනීම ය. (.........)

11. 'YES' ගිණුමක පාරිතෝෂික පොළිය (Bonus interest) සඳහා සුදුසුකම් ලබා ගැනීම පිණිස පවත්වා ගත යුතු අවම ශේෂය කවරේ ද?
   (1) රු. 2 000/- (2) රු. 10 000/- (3) රු. 15 000/- (4) රු. 25 000/- (.........)

12. ණය කාඩ්පත් හිමියන් සඳහා ලැබෙන පොළිය රහිත උපරිම ණය කාලය කවරේ ද?
   (1) දින 21 යි (2) දින 36 යි (3) දින 48 යි (4) දින 51 යි (.........)

13. 'ගුරුසෙත' ගුරුවරුන් සඳහා මහජන බැංකුව පිරිනමන ජනප්‍රිය ණය නිෂ්පාදනයකි. මෙම ණය ක්‍රමය යටතේ පුද්ගලික ඇපයක් මත ලබා දිය හැකි උපරිම ණය සීමාව කවරේ ද?
   (1) රු. මිලියන 1.0 (2) රු. මිලියන 1.5
   (3) රු. මිලියන 2.0 (4) රු. මිලියන 2.5 (.........)

14. ශ්‍රී ලංකා රජය කොළඹ - නුවර අධිවේගී මාර්ගය තැනීම සඳහා විදේශ රටවල විවිධ කොන්ත්‍රාත්කරුවන්ට ආරාධනා කරමින් සිටියි. අදාළ ව්‍යාපෘතිය ප්‍රදානය කරනු ලබන්නේ එක් කොන්ත්‍රාත්කරුවකුට ය. කුමන ආකාරයේ බැඳුම්කරයක් මේ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලනු ලබයි ද?
   (1) කාර්යසාධන බැඳුම්කරය (Performance bond)
   (2) ලංසු බැඳුම්කරය (Bid bond)
   (3) අත්තිකාරම් ගෙවීමේ බැඳුම්කරය (Advance payment bond)
   (4) රඳවා ගැනීමේ බැඳුම්කරය (Retention bond) (.........)

15. ශ්‍රී ලංකා මූල්‍ය වෙළෙඳපොළෙහි 'SLFR' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
   (1) Sri Lanka Forex Rate (2) Sri Lanka Foreign Currency Rate
   (3) Standing Lending Facility Rate (4) Security Lending Facility Rate (.........)



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

16. Slips මගින් කෙරෙන මුදල් පැවරීමක දී අය කළ හැකි උපරිම කොමිස් මුදල කවරේ ද?
(1) ගනුදෙනුවකට රු. 50/- ක් බැගින් (2) ගනුදෙනුවකට රු. 100/- ක් බැගින්
(3) ගනුදෙනුවකට රු. 150/- ක් බැගින් (4) උපරිම සීමාවක් දක්වා නැත (.........)

17. පහත දැක්වෙන කාණ්ඩවලට අයත් පුද්ගලයන්ගෙන් කවරකු බලයලත් ආයතන සමග NRFC ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් නොලබයි ද?
(1) විදේශ රටවල පදිංචිව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්
(2) Migrant Blocked ගිණුම් විවෘත කරන ලද පුද්ගලයන්
(3) ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින ශ්‍රී ලංකාවේ උපත ලද අය
(4) විදේශවල අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික සිසුන් (.........)

18. 'CAMPARI' යනු ණය යෝජනාවක් ඇගයීමේ දී යොදා ගන්නා ප්‍රවේශයන්ගෙන් එකකි. CAMPARI යන්නෙන් අදහස් වන්නේ
(1) Credit worthiness, Ability, Margin, Purpose, Amount, Repayment terms, Insurance
(2) Character, Ability, Margin, Purpose, Amount, Repayment terms, Insurance
(3) Character, Ability, Margin, Purpose, Amount, Rate, Insurance
(4) Character, Ability, Margin, Purpose, Amount, Repayment terms, Interest rate (.........)

19. සමාගමක ද්‍රවශීලතාව පිරික්සා බැලීමේ දී එහි මූල්‍ය වාර්තා ඉතා ප්‍රයෝජනවත් වේ. කෙසේ වෙතත් නිශ්චිත ද්‍රවශීලතාව මැන බැලීමේදී එහි සීමාකාරී බවක් දක්නට ලැබේ. ඊට හේතුව නම්
(1) කල්පිරීමේ අසමතුලිතතා (Maturity Mismatches) එමගින් නොසැපයීමයි.
(2) ද්‍රවශීලතා අනුපාත එමගින් නොසැපයීමයි.
(3) මූල්‍ය ප්‍රවාහ විශ්ලේෂණය එමගින් නොසැපයීමයි.
(4) එමගින් ඓතිහාසික තොරතුරු නොසැපයීමයි. (.........)

20. කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය ණය (SME Loans) බොහෝවිට වර්ගීකරණය කරනු ලබන්නේ
(1) මූල්‍ය ප්‍රවාහ පදනම් කර ගත් ණය ලෙස ය. (2) සුරකුම් පදනම් කර ගත් ණය ලෙස ය.
(3) ශේෂ පත්‍රය පදනම් කර ගත් ණය ලෙස ය. (4) සුරකුම් රහිත ණය ලෙස ය. (.........)

21. ව්‍යාපෘතියක මූල්‍ය ශක්‍යතාව මැන බැලීම සඳහා යොදා ගනු ලබන නිවැරදි ක්‍රමවේද වනුයේ
(1) NPV, IRR, පිළිගෙවුම් කාල ක්‍රමය (pay back period), ශුද්ධ මුදල් ප්‍රවාහය (Net cash flow)
(2) NPV, IRR, කාරක ප්‍රාග්ධනය (Working capital), මූල්‍ය අනුපාත (Financial ratios)
(3) මුදල් ප්‍රවාහ (Cash flow), මූල්‍ය අනුපාත, පොළී ආවරණ අනුපාතය (Interest service cover ratio)
(4) ද්‍රවශීලතාව (Liquidity), ලාභදායීතාව (Profitability), නුබුන්වත්භාවය පිළිබඳ අනුපාත (Solvency ratios) (.........)

22. ව්‍යාපෘතියක් මූල්‍යකරණය කිරීමේ දී සදාචාරාත්මක බාධක (Moral hazards) එල්ලවීම වැළැක්විය නොහැකි ය. මෙම සදාචාරාත්මක බාධකයන්ගේ බලපෑම අඩු කිරීමට බැංකුව කළ යුත්තේ
(1) වැඩිපුර සුරකුම් ඉල්ලා සිටීම ය.
(2) අදාළ අවශ්‍යතා සඳහා ණය මුදල් යොමු කිරීම ය.
(3) ණය ගිවිසුමේ කොන්දේසි වැඩි කිරීම ය.
(4) ණයකරුගේ ප්‍රාග්ධන සහභාගිත්වය වැඩි කරන ලෙස ඉල්ලා සිටීම ය. (.........)

23. පහත සඳහන් ඒවායින් ව්‍යාපාරයක ද්‍රවශීලතාව මැන බැලීම සඳහා යොදාගත නොහැකි වන්නේ
(1) ජංගම අනුපාතය ය. (2) ක්ෂණික වත්කම් අනුපාතය ය.
(3) තොග පිරිවැටුම් අනුපාතය ය. (4) කොටසක ඉපැයුම ය. (.........)



Department of Examinations Sri Lanka

24. සමූපකාර සමිතියක පාරිභෝගික අංශය සඳහා ණයක් සලකා බැලීමේ දී අනුමැතිය ලබා ගත යුත්තේ
(1) ආහාර හා සමූපකාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙනි.
(2) සමූපකාර සංවර්ධන නියෝජ්‍ය මහා කළමනාකරුගෙනි.
(3) සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ගෙනි.
(4) ජාතික සමූපකාර මණ්ඩලයෙනි. (………)

25. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි, ගනුදෙනුකරු විසින් ණයකාඩ්පතක ගෙවීම් පැහැර හැර ඇති විට එම පහසුකම පළමුවරට අවප්‍රමාණික අංශයට (substandard category) මාරු කරනු ලබන්නේ ගෙවීම් පැහැර හැරි දින සිට දින
(1) 90 කට පසුව ය. (2) 100 කට පසුව ය.
(3) 120 කට පසුව ය. (4) 180 කට පසුව ය. (………)

26. අක්‍රිය අංශයේ ණයවල පොළී ආදායම සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් වඩාත් අදාළ වේ ද?
(1) ලැබූ පොළී ආදායම ලාභය සෙවීමේ දී සැලකිල්ලට ගත නොහැකි අතර අවිනිශ්චිත ගිණුමට මාරු කළ යුතුය.
(2) නොලැබූ පොළිය ලාභය සෙවීමේ දී සැලකිල්ලට ගත නොහැකි අතර එය අවිනිශ්චිත ගිණුමට මාරු කළ යුතු ය.
(3) ණය මුදල අක්‍රිය ණය අංශයට මාරු කිරීමට පෙර නොලැබූ පොළිය ආදායමක් ලෙස සැලකිය හැකි ය.
(4) ණය මුදල අක්‍රිය අංශයට මාරු කිරීමට පෙර සහ පසු අවස්ථා දෙකේදී ම නොලැබුණු පොළිය ආදායමක් ලෙස සැලකිය නොහැකි ය. (………)

27. ඵලදායි ණය විපරම (credit monitoring) සම්බන්ධයෙන් අදාළ අවශ්‍යතාවයන්ගෙන් එකක් වනුයේ
(1) ණයගත් අය CRIB වාර්තාවේ ඇතුළත් නොවීමට වගබලා ගැනීම ය.
(2) ණයගත් අය ණය දීමට සුදුසු අයකු බවට තහවුරු කර ගැනීම ය.
(3) පවරන ලද බලය ණය ප්‍රතිපත්තියට අනුකූල දැයි තහවුරු කර ගැනීම ය.
(4) සියලුම ණය පවතින කොන්දේසිවලට අනුකූල දැයි තහවුරු කර ගැනීම ය. (………)

28. බැංකු ශාඛාවක ණය පසු විපරමේ දී වඩා ප්‍රයෝජනවත් වන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) ණය දීමෙන් පසුව විසිත්ත කිරීම ය. (2) MIS වාර්තා ය.
(3) සෝදිසි ලැයිස්තුව ය. (4) ණය කළඹ අනුපාත ය. (………)

29. ණය පැහැර හැරීමේ සම්භාවිතාව යනු ණය කළඹක ණය අවදානම මැනීමේ මිම්මකි. ණය කළඹක ණය පැහැර හැරීමේ සම්භාවිතාව යන්නෙන් අදහස් වන්නේ
(1) ණයකරු ණය ආපසු ගෙවීම පැහැර හැරීමට ඇති නැඹියාව පිළිබඳ තක්සේරුවකි.
(2) ණයකරු ණය ආපසු ගෙවීම පැහැර හැරියහොත් ණය මුදලේ අලාභ වන කොටසයි.
(3) ණයකරු ණය ආපසු ගෙවීම පැහැර හැරියහොත් සිදුවන මුළු අලාභයයි.
(4) ණයකරු හේතුවෙන් බැංකුව කොතරම් දුරට නිරාවරණය වී ඇති ද යන්න පිළිබඳ තක්සේරුවකි. (………)

30. ණය කළමනාකරණ රාමුව හා සම්බන්ධ වන ප්‍රධාන ක්‍රියාවලි හතර වනුයේ
(1) අවදානම හඳුනා ගැනීම , අවදානම මැනීම, අවදානම පසුවිපරම, අවදානම සැහැල්ලු කිරීම ය.
(2) අවදානම විශ්ලේෂණය, අවදානම හඳුනා ගැනීම, අවදානම පාලනය කිරීම, අවදානම සැහැල්ලු කිරීම ය.
(3) අවදානම ඇගයීම, අවදානම හඳුනා ගැනීම, අවදානම වර්ගීකරණය, අවදානම පසුවිපරම ය.
(4) අවදානම හඳුනා ගැනීම, අවදානම මැනීම, අවදානම පාලනය කිරීම, අවදානම පසුවිපරම ය. (………)

31. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි නිවැරදි අක්‍රිය ණය වර්ගීකරණය වනුයේ
(1) කල් ඉකුත්, අවප්‍රමාණික, අඩමාන, බොල් ය.
(2) කල් ඉකුත්, විශේෂයෙන් සඳහන් කරන ලද, අඩමාන, බොල් ය.
(3) විශේෂයෙන් සඳහන් කරන ලද, අවප්‍රමාණික, අඩමාන, බොල් ය.
(4) විශේෂයෙන් සඳහන් කරන ලද, කල් ඉකුත්, අවප්‍රමාණික, බොල් ය. (………)



Department of Examinations Sri Lanka

32. දේපළක බලෙන් විකිණිය හැකි මිල (forced sale value) යන්නෙන් අදහස් වන්නේ
    (1) දේපළ විවෘත වෙළෙඳපොළෙහි නොදන්නා පක්ෂයකට විකිණීමේ දී ගනුදෙනු වන වටිනාකම ය.
    (2) පෞද්ගලික වැඩපිළිවෙළක දී තීරණය වන වටිනාකම ය.
    (3) වෙළෙඳපොළෙහි බලවේගයන්ට අනුව තීරණය වන වටිනාකම ය.
    (4) ණය මුදලේ ගෙවීම් පැහැර හැරීමක දී දේපළ බැංකුව විසින් උපලබ්ධි කිරීමේ දී ඇති වන වටිනාකම ය. (.........)

33. ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන විනිමය පාලන රෙගුලාසි අනුව නම් කරන ලද විදේශ මුදල් ලැයිස්තුවට මෑතක දී ඇතුළත් කර ගන්නා ලද විදේශ මුදල වන්නේ
    (1) යුරෝ ය. (2) චීන රෙන්මිනිබි ය.
    (3) ඩෙන්මාර්ක් ක්‍රෝනර් ය. (4) නවසීලන්ත ඩොලර් ය. (.........)

34. රැස්කිරීම පිළිබඳ යුනිෆෝම් නීතිරීති අනුව පිරිසිදු රැස්කිරීම යන්නෙන් අදහස් වන්නේ
    (1) වාණිජ ඉන්වොයිසිය, ප්‍රවාහන ලේඛන, අයිතිය දක්වන ලේඛන, වෙනත් සමාන ලේඛන රැස්කිරීමයි.
    (2) වාණිජ ඉන්වොයිසිය, විනිමය බිල්පත, පොරොන්දු නෝට්ටුව,චෙක්පත් හෝ සමාන ලේඛන රැස්කිරීමයි.
    (3) වාණිජ ලේඛන සමග එකට ඉදිරිපත් නොකරන ලද මූල්‍ය ලේඛන රැස්කිරීමයි.
    (4) විනිමය බිල හැර අනෙකුත් වාණිජ ලේඛන රැස් කිරීමයි. (.........)

35. LIBOR යන්නෙන් අදහස් වන්නේ
    (1) London International Borrowing Rates
    (2) London International Banks Offered Rates
    (3) Lankan Inter Bank Offered Rates
    (4) London Inter Bank Offered Rates (.........)

36. USD / LKR අනුපාතය පහත කවර ප්‍රවෘත්තියකට වඩාත් සංවේදී වේ ද?
    (1) ඇමෙරිකානු ෆෙඩරල් සංචිතය එහි අනුපාතික පදනම් අංක 50 කින් ඉහළ දැමීම
    (2) ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොළී අනුපාතික පදනම් අංක 50 කින් පහළ දැමීම
    (3) වෙළෙඳ පරතරය පසුගිය වසරට සාපේක්ෂව 20% කින් ඉහළ යාම
    (4) ශ්‍රී ලංකා රජය චීනයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500 ක ණය මුදලක් ලබා ගැනීම (.........)

37. ණයවර ලිපිය ප්‍රධාන වශයෙන් නිකුත් කරන බැංකුව හා ආනයනකරු අතර ඇතිවන ගිවිසුමකි. මේ යටතේ නිකුත් කරන බැංකුව,
    (1) ආනයනකරුට ගෙවීමට එකඟත්වය පලකරයි.
    (2) සහතික කරන ලද ලේඛන මත ආනයනකරුට ගෙවීමට එකඟත්වය පලකරයි.
    (3) සියලුම අදාළ ලේඛන ලැබුණු පසු නිර්යාතකරුට ගෙවීමට එකඟත්වය පලකරයි.
    (4) අදාළ ආනයනකරු විසින් නිර්යාතකරුට ගෙවීම් පැහැර හැරියහොත් ගෙවීම් කිරීමට එකඟත්වය පළකරයි. (.........)

38. ස්විට්සර්ලන්තයේ මුදල්වල අන්තර්ජාතික සංකේතය වන්නේ,
    (1) SEK (2) EUR (3) CHF (4) SZL (.........)

39. ආයාතකරු භාණ්ඩ ඔහුගේ ගබඩාවට ගෙන්වා ගැනීමටත්, ඒ හා සම්බන්ධ සියලුම වියදම් දරා ගැනීමටත් කැමතිවන්නේ නම්, සුදුසු INCO වගන්තිය කුමක් ද?
    (1) DAT (2) CAF (3) FAS (4) DDP (.........)

40. USD / LKR අතර අනුපාතය 145.50 / 60 වන්නේ නම්, ඔබගේ බැංකුවේ ආනයන ගණුදෙනුකරුවකුට අදාළව යොදාගනු ලබන විනිමය අනුපාතය වන්නේ පහත කවරක් ද?
    (1) 145.50 (2) 145.55 (3) 145.60 (4) 146.60 (.........)

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

41. විස්ල් බ්ලෝවර් යාන්ත්‍රණය බැංකුවේ ප්‍රතිපත්ති රාමුවේම කොටසකි. විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තිය ආවරණය කළ යුත්තේ,

(1) ඕනෑම තරාතිරමක සේවකයකු කරන ලද අපචාර සහ දූෂණ වාර්තා කිරීමේ පිළිවෙත සහ එහි රහස්‍යගතභාවයයි.

(2) අපචාර සහ වංචනික ක්‍රියා පරීක්ෂා කිරීමේ විගණන ක්‍රියාවලියයි.

(3) වංචා සහ නොසැලකිලිමත්කම් හේතුවෙන් සිදුවන ගිණුම්මය පරස්පරයන් පිළිබඳව කටයුතු කිරීමේ ගිණුම් පිළිවෙතයි.

(4) වංචා සහ වැරදි පිළිබඳ පරීක්ෂාවන්හි දී වාර්තා කළ යුතු බලධාරීන් කවුරුන් ද සහ ඔවුන්ගේ වගකීම් මොනවා ද යන්නයි. (.........)

42. රජයේ සුරැකුම්පත් සාමාන්‍යයෙන් සලකන්නේ අවදානම් රහිත ආයෝජනයක් ලෙසිනි. මේ සම්බන්ධයෙන් වඩාත් අදාළ වන්නේ පහත ඒවායින් කවරක් ද?

(1) රජයේ සුරැකුම්පත්වලට වෙළඳපොළ අවදානමක් නැත.

(2) රජයේ සුරැකුම්පත් ණය අවදානමින් පමණක් නිදහස් ය.

(3) රජයේ සුරැකුම්පත් ණය අවදානමින් සහ වෙළඳපොළ අවදානමින් යන දෙකෙන්ම නිදහස් ය.

(4) රජයේ සුරැකුම්පත් සියලුම අවදානම්වලින් නිදහස් ය. (.........)

43. බැංකුවකට තැන්පත්වලින් 100% ක් ණය දීමට නොහැකිවීමට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ පහත ඒවායින් කවරක් ද?

(1) ද්‍රවශීල අවශ්‍යතා සඳහා තැන්පත් මුදලෙන් කොටසක් ආයෝජනය කළ යුතු ය.

(2) තැන්පතුවලින් කොටසක් මුදල් සංචිතය, ව්‍යවස්ථාපිත සංචිතය සහ ද්‍රවශීලතාව සඳහා වෙන්කර තැබිය යුතු ය.

(3) මුදල් සංචිතය, ව්‍යවස්ථාපිත සංචිතය, ද්‍රවශීලතාව සහ අක්‍රිය ණය සඳහා අරමුදල් වෙන්කර තැබිය යුතු ය.

(4) මුදල් සංචිතය සඳහා ප්‍රතිපාදන කළ යුතු ය. (.........)

44. අධිවෙළඳාම, ව්‍යාපාරය දුර්වල තත්වයක පවතින බව පෙන්වන එක් ලක්ෂණයකි. අධිවෙළඳාම යන්නෙන් අදහස් වන්නේ,

(1) ප්‍රාග්ධනයේ පරිමාව ඉක්මවා විකුණුම් සිදු කිරීමයි.

(2) ප්‍රමාණවත් නොවන සම්පත් භාවිත කරමින් ව්‍යාපාර කටයුතු කරගෙනයාමට උත්සාහ කිරීමයි.

(3) තොග සහ ණය ගැතියන් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට උත්සාහ කිරීමයි.

(4) අතිවිශාල ණය බරක් ඇති කරමින් තොග ණයට ලබා ගැනීමයි. (.........)

45. 2016 ජනවාරි මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) ඉහළ දමන ලදී. ඒ අනුව දැනට බලපවත්වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වන්නේ,

(1) 6.0% කි. (2) 6.5% කි. (3) 7.0% කි. (4) 7.5% කි. (.........)

46. පක්ෂපාතී ගනුදෙනුකරුවන් ව්‍යාපාරික ආයතනයකට වැදගත් වන්නේ,

(1) ආයතනයේ මිල උපාය මත ඔවුන් පෙළඹී ඇති නිසා ය.

(2) තරගකරුවන්ගේ භාණ්ඩවලට වඩා සමාගමේ භාණ්ඩවලට ඔවුන් වැඩි කැමැත්තක් දක්වන නිසා ය.

(3) සමාගමේ නිෂ්පාදන මිල දී ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ගේ දෙමව්පියන් සහ යාළු මිත්‍රාදීන් ඔවුන් පෙළඹවීම නිසා ය.

(4) පවතින පාරිසරික සහ අලෙවිකරණ බලපෑම් නොසලකා නැවත සමාගමේ භාණ්ඩ මිල දී ගැනීම සඳහා කරනු ලබන දැඩි කැප කිරීම නිසා ය. (.........)

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

47. සයිබර් අවදානම් හේතුවෙන් බැංකුවලට මෑතක දී විවිධ ආකාරයේ අලාභවලට මුහුණ දීමට සිදු වී ඇත. 2016 පෙබරවාරි මස පෙඩරල් රිසව් බැංකුවේ ගිණුමකින් ශ්‍රී ලංකාවේ සහ පිලිපීනයේ පිහිටි පුද්ගලික බැංකු ගිණුම්වෙත අමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලයන 101 ක මුදලක් වංචනිකව මාරු කිරීම හඳුන්වන්නේ පහත කවරකින් ද?
   (1) කාර්බනැක් ප්‍රහාරය
   (2) ජේ. පී. මෝර්ගන්චේස් දත්ත සොරකම
   (3) බංග්ලාදේශ මහා බැංකු ප්‍රහාරය
   (4) රෝයල් බෑන්ක් ඔෆ් ස්කොට්ලන්ඩ් හි තොරතුරු තාක්‍ෂණ බිඳ වැටීම (.........)

48. 2011 - 2012 වර්ෂවල ණය අර්බුදයකට මුහුණ පෑවේ කවර රටක් ද?
   (1) බ්‍රසීලය (2) රුසියාව (3) තුර්කිය (4) ග්‍රීසිය (.........)

49. 2015 වසර සඳහා නිකුත් කරන ලද මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව 31.12.2015 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහජන බැංකුව උපයන ලද බදු පෙර ලාභය වන්නේ,
   (1) රු. බිලියන 12.6 කි. (2) රු. බිලියන 14.2 කි.
   (3) රු. බිලියන 19.5 කි. (4) රු. බිලියන 20.3 කි. (.........)

50. 2015 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය කොපමණ ද?
   (1) රු. බිලියන 1027 කි. (2) රු. බිලියන 1077 කි.
   (3) රු. බිලියන 1177 කි. (4) රු. බිලියන 1277 කි. (.........)

* * *

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

මහජන බැංකුවේ සහකාර කළමනාකාර (3 - III) ශ්‍රේණියට
උසස් කිරීම සඳහා ලිඛිත තරග විභාගය - 2016

**(02) දෙවන ප්‍රශ්න පත්‍රය**

පැ. තුනයි

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **23** කින් හා කොටස් **07** කින් සමන්විතය.
- **I** කොටස හා **II** කොටස අනිවාර්ය වන අතර අපේක්ෂකයින් එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන **I** හා **II** යන කොටස්වලින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
- ඊට අමතරව එක් කොටසකින් උපරිම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන **III** කොටස සිට **VII** කොටස තෙක් කොටස්වලින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුයි.
- කොටස් සියල්ලගෙන් ම ප්‍රශ්න අටකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

**I කොටස - බැංකු කටයුතු පිළිබඳ නීතිය හා පරිචය**

1. (i) චෙක්පතක් විනිමය බිල්පතක් (Bill of Exchange) වන අතර මේ දෙක අතර වෙනස්කම් ද ඇත. ඒ මොනවාද? *(ලකුණු 05 යි)*
   (ii) ගෙවන බැංකුකරුට තම ගනුදෙනුකරුවන්ගේ ගිණුම හර (debit) කිරීමට බලයක් නොමැති අවස්ථා සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*
   (iii) බැංකුවකට තම ගනුදෙනුකරු පිළිබඳ තොරතුරු තෙවන පාර්ශ්වයකට හෙළිදරව් කළ හැකි අවස්ථා සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

2. (i) රංජිත්ට ගෙවිය හැකි චෙක්පතක් සොරකම් කර ධයස්ට පැවරිය හැකි වන පරිදි රංජිත්ගේ අත්සන රොහාන් වංචනිකව තබයි.
   රංජිත්ට එරෙහිව මෙම චෙක්පත රඳවා ගැනීමට හෝ රොහාන් හැර අනෙකුත් පූර්ව පාර්ශ්වයන්ට එරෙහිව බලගැන්වීමට ධයස්ට හැකියාවක් ඇත්ද? *(ලකුණු 05 යි)*
   (ii) පහත සඳහන් අවස්ථාවල ඇතිවන තත්ත්වය කෙසේද?
      (a) රංජිත්ගේ අත්සන වංචනිකව තබන ලද චෙක්පත් තමාගේ නිවැරදි අත්සන යැයි රංජිත් විසින් ධයස්ට කියා සිටි නම් සහ ධයස් ඒ පිළිබඳව විශ්වාසයෙන් කටයුතු කර ඇත්නම්, *(ලකුණු 05 යි)*
      (b) රංජිත් 'කල්පිත හෝ ජීවමාන නොවන ආදායකයෙකු (Fictitious or Non Existent Payee)' වන අවස්ථාවක දී *(ලකුණු 05 යි)*

3. බැංකුකරු ගනුදෙනුකරු සබඳතාවය අනුව ගනුදෙනුකරු ණයගැතියා වී බැංකුකරු ණයහිමියා වන අවස්ථාවක දී ගෙවීම් විසර්ජනය (Appropriation of payment) අදාළ කරගනු ලැබේ. (සමහර විටෙක මෙහි අනෙක් පැත්ත සිදුවන අවස්ථාත් ඇත.) මෙය ගනුදෙනුකරු විසින් ඔහුගේ ගිණුම වෙත වරින් වර කරන ලද මුදල් ගෙවීම් පිළිබඳව බැඳී ඇත. මෙම තත්ත්වය යටතේ,
   (i) "ගෙවීම් විසර්ජනය" යන්නෙන් කුමක් අදහස් කරන්නේද යන්න සහ බැංකුකරුවන්ට එය වැදගත් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*
   (ii) ගනුදෙනුකරුගේ හා බැංකුකරුගේ විසර්ජන අයිතිවාසිකම් නිදසුන් සහිතව විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

4. රැස්කරන බැංකුකරු නියෝජිතයෙකුගේ (Agent) තත්ත්වයෙන් ක්‍රියා කරයි. එබැවින් ඔහු නොසැලකිලිමත් නොවී විමසිල්ලෙන් යුතුව සාධාරණ නිපුණත්වයකින් කටයුතු කිරීම අපේක්ෂා කරයි. එසේ නොවන විටෙක දී රැස්කරන බැංකුකරු, අපවර්තනය (conversion) හා නොසැලකිලිමත් බව (negligence) පිළිබඳව වගකීමට බැඳේ.
   මෙම තත්ත්වය යටතේ පහත සඳහන් දෑ දක්වන්න.
   (i) "අපවර්තනය" යන්නෙහි අදහස *(ලකුණු 02 යි)*
   (ii) රැස්කරන බැංකුකරුවන් සඳහා ඇති ව්‍යවස්ථාපිත රැකවරණය *(ලකුණු 03 යි)*
   (iii) බැංකුව නොසැලකිලිමත් වූ බවට පත්වූ අවස්ථා සහ එයට සම්බන්ධ තීරණය වූ නඩු තීන්දු *(ලකුණු 10 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

### II කොටස - විවිධ ගණුදෙනුකාර ගිණුම් හා අනෙකුත් බැංකු සේවා

5. සීමිත රොඩ්රිගෝ සහ (පෞද්ගලික) සමාගම විසින් තමන් සමඟ වෙළඳාම් කිරීමට බලාපොරොත්තු වන සීමිත ඊස්ට් පවර් (වෙළඳ සමාගමකි) සමාගමෙහි ණය යෝග්‍යතාවය පිළිබඳ "තත්ත්ව වාර්තාවක්" ඔවුන්ගේ බැංකුව වන එච් ඇන්ඩ් පී බැංකුව (වාණිජ බැංකුවකි) හරහා ලබාගන්නා ලදී.
එම මතය මත ක්‍රියාකිරීමේ ප්‍රතිඵලය වූයේ සීමිත රොඩ්රිගෝ සහ සමාගම (පෞද්ගලික) බරපතල අලාභ ලැබීමයි. වගකීමෙන් මුක්ත වගන්තිය (disclaimer clause) මෙම තත්ත්ව වාර්තාවෙහි ඇතුළත් කර නොතිබුණි. නොසැලකිලිමත්ව පිළියෙල කරන ලද වාර්තාව හා සැලකිලිමත් වී කටයුතු කිරීමේ යුතුකම කඩකිරීම මත සීමිත රොඩ්රිගෝ සහ සමාගම (පෞද්ගලික) සිදුවූ හානිය වෙනුවෙන් වන්දි ලබා ගැනීමට නීතිය මගින් කටයුතු කිරීමට අදහස් කරගෙන සිටී.
එච් ඇන්ඩ් පී බැංකුවේ නීතිමය තත්ත්වය පිළිබඳ අදහස් දක්වන්න. *(ලකුණු 15 යි)*

6. එම්.ආර්.එස්. ට්‍රේඩින් සමාගමේ (හවුල් ව්‍යාපාරයේ) හවුල්කරුවෙකු වන ඩැනියෙල් මහතා නිශ්චිත බංකොලොත්කරුවෙකු බව දක්වමින් නියෝගයක් ඔබ බැංකුවට ලැබී ඇත. මෙම නියෝගය ලැබෙන අවස්ථාවේදී හවුල් ව්‍යාපාර ගිණුමේ බැර ශේෂයක් පවතී. බංකොලොත් හවුල්කරු විසින් නිකුත් කරන ලද චෙක්පත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර ඇත.
   (i) මෙම බංකොලොත් නියෝගය ලැබුණු වහාම ඔබ ගන්නා ක්‍රියාමාර්ගය හා මෙවැනි අවස්ථාවකදී ඔබ කටයුතු කරන ආකාරය සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*
   (ii) නියෝගය ලැබෙන අවස්ථාවේදී හවුල් ව්‍යාපාර ගිණුම අයිරා ගැන්වී තිබුණේ නම් ඔබේ ක්‍රියාමාර්ගය වෙනස් වන්නේද? පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*
   (iii) හවුල් ව්‍යාපාරය වෙනුවෙන් බංකොලොත් නියෝගය ලැබුණේ නම් ඔබ කටයුතු කරන ආකාරය කෙබඳු ද? පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

7. සොලමන් පෙරේරා මහතා ඔබ ශාඛාවේ ජංගම ගිණුමක් පවත්වාගෙන යයි. සොලමන් පෙරේරා මහතා නමින් රුපියල් 625 000 ක ආදායම් බදු නියෝගයක් අද උදෑසන ශාඛාවට ලැබී ඇත. නියෝගය ලැබෙන අවස්ථාවේදී ජංගම ගිණුමේ ශේෂය රුපියල් 656 000 කි. ඔහුගේ ණය ගිණුමේ පිටහිටි ශේෂය රුපියල් 900 000 කි. අයකර ගැනීමට ඇති ණය වාරික හා පොලිය රුපියල් 95 800 කි. රුපියල් 52 500 ක්වූ නිෂ්කාෂණය නොවූ චෙක්පතක් ද ඇත. මෙබඳු අවස්ථාවකදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආදායම් බදු නියෝගය වෙනුවෙන් ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? *(ලකුණු 15 යි)*

8. (i) වී.කේ.එස්. ට්‍රේඩින් සමාගම (හවුල් ව්‍යාපාරය) ඔබ ශාඛාවේ ජංගම ගිණුමක් ආරම්භ කිරීමට කැමැත්තෙන් සිටී. හවුල් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සඳහන් හවුල්කරුවන් සහ ඔවුන්ගේ වයස් වන්නේ,

| | |
|---|---|
| රවි පෙරේරා | අවු 42 |
| සුනිල් පෙරේරා | අවු 37 |
| ආනන්ද පෙරේරා | අවු 14 |
| ප්‍රේමලාල් පෙරේරා | අවු 32 |

   (ii) ඔබ ශාඛාවේ තනි පුද්ගල (proprietorship) ව්‍යාපාර ජංගම ගිණුමක් පවත්වාගෙන යන ජෝර්ජ් ප්‍රනාන්දු සීමිත ජෝර්ජ් ප්‍රනාන්දු (පෞද්ගලික) සමාගම නමින් (එකම අධ්‍යක්ෂ ඔහු වන) ජංගම ගිණුමක් විවෘත කිරීමට අදහස් කරයි.
      (a) ඉහත (i) හා (ii) සඳහන් ඉල්ලීම් සඳහා ජංගම ගිණුම් විවෘත කිරීමට ඔබ එකඟ වන්නේද? ඔබ ගන්නා ක්‍රියාමාර්ගවලට හේතු පහදන්න. *(ලකුණු 05 යි)*
      (b) එසේ ගිණුම් විවෘත කිරීමට එකඟ වන්නේ නම්,
         (I) ගිණුම් විවෘත කිරීමට පෙර ඔබ ගන්නා පියවර මොනවාද? *(ලකුණු 05 යි)*
         (II) ගිණුම් විවෘත කිරීම සඳහා ඔබ ලබාගන්නා ලියවිලි මොනවාද? *(ලකුණු 05 යි)*

### III කොටස - බැංකු මූල්‍ය පහසුකම්

9. සීමිත ඒ.බී.සී. (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ බද්ධ හා කතිපය (joint & several) ඇපය මත ණය මුදලක් ලබාදීමට ඔබේ ශාඛාව තීරණය කර ඇත. එසේ තිබියදී අතිරේක සුරැකුමක් ලෙස සමාගම සතු නිදහස් දේපළක් ලබා දිය හැකි බව අධ්‍යක්ෂවරුන් අද ඔබ වෙත දන්වා සිටී.
මෙබඳු අවස්ථාවක,
   (i) කළමනාකරුගේ අවධානයට ඔබ විසින් යොමුකරන කරුණු මොනවාද? *(ලකුණු 04 යි)*
   (ii) නිදහස් දේපළක් සුරැකුමක් ලෙස ලබාගැනීමේදී බැංකුවේ රැකවරණය පිණිස, අවශ්‍ය අවස්ථාවකදී සුරැකුමෙන් ආවරණය කර ගැනීමට සලකා බැලිය යුතු කරුණු මොනවාද? *(ලකුණු 06 යි)*



Department of Examinations Sri Lanka

10. ව්‍යාපාරිකයෙකු වන චන්ද්‍රපාල මහතා පුද්ගලික හා ව්‍යාපාරික ජංගම ගිණුම් ඔබ ශාඛාවේ පවත්වාගෙන යයි. ඔහු රන් බිස්කට්, සහ රන් ආභරණ ඇතුළු විශාල ධනයක් ඒකරාශී කරගෙන ඇත. ඔහු ඔබ ශාඛාව අමතා ඔහුට, ඔහුගේ ව්‍යාපාරයේ ද්‍රවශීලතාව පවත්වාගැනීමේ ගැටලුවක් ඇති බැවින් ඒ සඳහා ඔහුගේ මිත්‍රයෙකු වන කුමාර් මහතාගේ පෞද්ගලික ඇපය මත රුපියල් 300 000ක අයිරාවක් මාස 6 ක් සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක් කරයි. නමුත් කුමාර් මහතාගේ ඇපය, ඉල්ලා ඇති මුදල සඳහා යෝග්‍ය නොවන බව ඔබ දනී. කෙසේ වෙතත් චන්ද්‍රපාල මහතාගේ කලින් ණය ගනුදෙනු අනුව ඔබ සෑහීමකට පත් නොවුනත් ඔහුට උදව්වක් කිරීමට ඔබට වුවමනා වී ඇත. චන්ද්‍රපාල මහතා කිසිම අවස්ථාවක රන් උකසට තබා කිසිම පහසුකමක් ලබාගෙන නැත. මෙබඳු අවස්ථාවකදී කුමාර් මහතාගේ පෞද්ගලික ඇපය නොගෙන ඔහුගේ රන් භාණ්ඩ උකස් කර අවශ්‍ය පහසුකම ලබාගැනීමට චන්ද්‍රපාල මයා පොළඹවා ගන්නේ කෙසේද? *(ලකුණු 10 යි)*

11. විශාල ව්‍යාපෘතියක් මූල්‍යනය සඳහා රුපියල් මිලියන 3.0 ක ණයක් ඒබීසී බැංකුව විසින් තම ගනුදෙනුකරුවකු වන ගොඩ්වින්ට ඔහුගේ පියා වන, සමාගමක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ විධායක ගෝඩ්න් ගේ එකම ඇපය මත අනුමත කරන ලදී. ගොඩ්වින් හා ඔහුගේ පියා බැංකුවේදී ලියවිලි අත්සන් කරන අවස්ථාවේදී ඇපය පිළිබඳ කිසිවක් ගෝඩ්න් විසින් විමසා නැත. ගොඩ්වින්ගේ ව්‍යාපෘතිය අසාර්ථක වූ අතර ඒ නිසා ණය මුදල අක්‍රිය තත්ත්වයට පත්විය. ඒබීසී බැංකුව ඇපය බලගැන්වීමට තීරණය කර ඇත. ඇපය අත්සන් කරන අවස්ථාවේදී ඇපයේ අරමුණ පිළිබඳව කිසිම තොරතුරක් බැංකුව තමා වෙත හෙළිදරව් නොකළ නිසාත්, තමා ඇපය අත්සන් කළේ තම පුතාගේ බලවත් ඉල්ලීම හා බලකිරීම නිසාත් බැවින් මෙම ණය මුදල සඳහා තමා වගකීමට බැඳී නැති බව ගෝඩ්න් විසින් දන්වා සිටී.
ඇපකරු ගෝඩ්න් තම රැකවරණය පිණිස ගෙන ඇති මෙම තත්ත්වයේ නීතිමය බලපෑම ඔබ බැංකුවේ ණය අංශයේ සහකාර කළමනාකරුවෙකු ලෙස කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

## IV කොටස - ණය පරිපාලනය හා අයකිරීම්

12. කුමන ණය අයකරගැනීමේ පනතකින් පරාටේ බලය (Parate Execution) ක්‍රියාත්මක කළ හැකිද යන්නත්, නිශ්චල දේපළ වෙන්දේසි කිරීම සඳහා පරාටේ බලය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කිරීමට ඉදිරිපත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවේ අන්තර්ගත කළ යුතු කරුණු සම්බන්ධවත් ඔබගේ ණය නිලධාරියා දැනගැනීමට කැමැත්තෙන් සිටී. පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

13. 2015 මාර්තු මාසයේදී නිවාස දේපළ උකසක් මත රුපියල් මිලියන 1.5 ක නිවාස ණයක් ඔබ බැංකුව විසින් අල්විස් මහතාට ප්‍රදානය කර ඇත. මෙම පහසුකම හිඟ හිට ඇති බවත් උකස් බැඳුම්කරය සිදු කළ නීති නිලධාරියා විසින් එය ලියාපදිංචිය සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට යවා නැති බවත් ඔබ දැනගනී. මෙබඳු අවස්ථාවකදී, බැංකුවේ නීතිමය තත්ත්වය සහ බැංකුවට ඇති අවදානම අඩුකර ගැනීම සඳහා ප්‍රායෝගික විසඳුමක් ඇත්නම් එය ද විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

14. රුපියල් මිලියන 2.0 කට අගය කරන ලද වෙළඳ තොගයේ සුරැකුම මත රුපියල් මිලියන 1.0 ක ණයක් තනි පුද්ගල ව්‍යාපාරයක් වෙත මීට අවුරුදු 2 කට පමණ ඉහතදී ප්‍රදානය කර ඇත. තවද මෙම ණය මුදලේ පසුගිය මාස 14 ක වාරික නොගෙවා ඇති අතර ණය ගිණුම අක්‍රිය අංශයට මාරුකර ඇත. අද දින බැංකුවට පැමිණි ණයකරු ණය මුදල ගෙවීම පැහැර හැරීමට හේතු ලෙස පහත සඳහන් කරුණු දන්වා සිටී.
   (i) දැනට මාස 14 කට කලින් අනපේක්ෂිත ගින්නකින් තමාගේ තොග හා ව්‍යාපාර පරිශ්‍රය විනාශ විය.
   (ii) උපකරණ හා ස්ථාවර වත්කම්වලින් සමහරක් තොග ලැයිස්තුවේ ඇතුළත් කර තිබුණි.
   (iii) තොග ලැයිස්තුවේ ඇතුළත් කර තිබූ සමහර අයිතම ණයට මිලදී ගත් ඒවා වන අතර ඒවා විකිණීමෙන් ලත් මුදල් එම භාණ්ඩ මිලට ගත් සැපයුම්කරුවන්ට ගෙවන ලදී.

ඉහත කරුණු සැලකිල්ලට ගත් කල සුරැකුමෙහි දුර්වලතාවය හේතුවෙන් ණය මුදල අයකරගැනීම අපහසු බව ඔබේ බැංකුව නිශ්චිතව දැනගනී.
සුරැකුම දුර්වලවීම කෙරෙහි බලපෑ හේතු හා ණය මුදල ආපසු අය නොවීම පිළිබඳව පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

## V කොටස - ජාත්‍යන්තර බැංකු කටයුතු

15. (i) ජාත්‍යන්තර වෙළඳාමේදී අපනයනකරුවන්ට ගෙවීම සඳහා ආනයනකරුවන් විසින් යොදාගන්නා ප්‍රධාන ගෙවීම් ක්‍රම හතර සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*
   (ii) ඔබ අංශයට අනුයුක්ත කළ නව නිලධාරියා පහත සඳහන් යෙදුම්වලින් කුමක් අදහස් කරන්නේද? යන්න විස්තර කරන ලෙස ඉල්ලා සිටී. ඔහුට උපදෙස් දෙන්න.
      (a) ණයවර ලිපි (Documentary credits)
      (b) සලේඛන රැස්කිරීම (Documentary collections) *(ලකුණු 08 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

16. ජාත්‍යන්තර වෙළඳාමේදී ගැනුම්කරුට හෝ විකුණුම්කරුට (හෝ නිෂ්පාදකයාට) තම වෙළඳ ගිවිසුම සම්පූර්ණ කිරීමේදී මූල්‍ය පහසුකම්වල අවශ්‍යතාවය නිරතුරුව දැකිය හැකිය. මෙබඳු අවස්ථාවලදී ආනයනකරුවන්ට හා අපනයනකරුවන්ට විවිධ මූල්‍ය පහසුකම් ඔබ බැංකුව විසින් ප්‍රදානය කරනු ලබයි. එබඳු පහසුකම් වර්ග සඳහන් කර ඒවා සෑම එකක්ම විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

17. අලුතින් ආරම්භ කළ මෝටර් රථ අමතර කොටස් හා උපාංග ආනයනය කිරීමේ ව්‍යාපාරයක කළමනාකාර අධ්‍යක්ෂවරයා වන ලයනල් පෙරේරා මහතා ණයවර ලිපිය විවෘත කරන අවස්ථාවේදීම ඉදිරි විනිමය ගිවිසුමකට ද (Forward Exchange Contract) එළැඹීමට කැමැත්තෙන් සිටී. ඔහු මීට පෙර ඉදිරි විනිමය ගිවිසුමකට එළැඹී නොමැති අතර ඉදිරි විනිමය ගිවිසුම යන්නෙන් කුමක් අදහස් කරන්නේද? යන්නත් ආනයනකරුවෙකුට එම ගිවිසුමට ඇතුළත් වීමෙන් ඇති ප්‍රතිලාභ කවරේද? යන්නත් විමසා සිටී. ඔහුට උපදෙස් දෙන්න. *(ලකුණු 10 යි)*

### VI කොටස - ශාඛා මෙහෙයුම් කටයුතු

18. ඔබේ බැංකුවත් අනෙකුත් ආයතන මෙන් ගනුදෙනුකරුවන් සඳහා වැඩිදියුණු කරන ලද පහසුකම් ලබාදීමත් වර්ධනය ඉහළ නැංවීමත් අපේක්ෂාවෙන් සමහර වෙනස්කම් හඳුන්වා දී ඇත. ඒ යටතේ ඔබ ශාඛාවේ දී ක්‍රියාත්මක කළ යුතු වෙනස්වීම් පිළිබඳව ඔබට දැනුම් දී ඇත. ඔබ විසින් රැස්වීමක් කැඳවා ඒ බව දැනුම් දුන් අවස්ථාවේ සේවක මණ්ඩලයේ සමහරෙක් එම යෝජිත වෙනස්කම්වලට විරෝධතාවක් දක්වන ලදී. වෙනස්වීම් හඳුන්වාදීමේදී විරෝධතා ඇතිවීමට බලපාන හේතු මොනවාදැයි සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

19. මෙම වසර තුළදී මුළු තැන්පතු 25% කින් හා ලාභය 20% කින් වැඩිකිරීමට ඉලක්කයක් ප්‍රධාන කාර්යාලයෙන් ලබා දී ඇති නගර ශාඛාවකට ඔබ ස්ථාන මාරු කර යවා ඇත. මෙම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රමවේද ඇතුළත් සැලැස්මක් සකස් කරන ලෙස කළමනාකාරතුමා ඔබෙන් ඉල්ලා සිටී. තැන්පතු හා ලාභ ඉහළ නැංවීම සඳහා ඔබ සැලසුම් කරන්නේ කෙසේද? *(ලකුණු 10 යි)*

20. ආයතනික ව්‍යුහය, නිමැවුම් හා සේවාවන් සැපයීම හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය යනාදියේ වෙනස්කම් කිරීම සඳහා අන්තර්ජාලය හරහා කෙරෙන වෙළඳ ගනුදෙනු (E-Commerce) හඳුන්වාදීම හා තොරතුරු තාක්ෂණයේ දියුණුව සියලු බැංකු හා මූල්‍ය ආයතනයන්ට අවශ්‍ය වී ඇත. මෙබඳු තත්ත්වයකදී,
   (i) අන්තර්ජාලය හරහා කෙරෙන වෙළඳ ගනුදෙනු හඳුන්වාදීම ඔබ බැංකුවේ ගනුදෙනුකරුවන්ට වාසි අත්කර දීමට කෙතෙක් දුරට දායක වී ඇත්ද? *(ලකුණු 05 යි)*
   (ii) තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ඔබ බැංකුවට පාඩු ගෙන දෙන ආකාරයේ තර්ජන ගණනාවක් ඇතිකිරීමට සමත් විය හැකිය. එබඳු අවස්ථා පහක් නම්කර විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

### VII කොටස - අලෙවිකරණය, කළමනාකරණය හා නූතන බැංකු ප්‍රවණතා

21. කළමනාකරුවන්ගේ ප්‍රධාන නායකත්ව කාර්යභාර තුනක් ජෝන් ඇඩයාර් (John Adair) විසින් දක්වා ඇත. අනාගත කළමනාකරුවෙකු ලෙස ඔබේ ශාඛාවේ සේවක මණ්ඩලයට නායකත්වය දීමේදී අනුගමනය කරනු ලබන ප්‍රධාන කාර්යභාරයන් තුන මොනවාද? *(ලකුණු 03 යි)*
ඒවා එකින් එක විස්තර කරන්න. *(ලකුණු 07 යි)*

22. ඔබේ බැංකුව විශාල ගනුදෙනුකාර පදනමක් සහිත රාජ්‍ය බැංකුවක් බැවින් දිගු කලක් බැංකුවේ රැඳී සිටි ගනුදෙනුකරුවන් වෙනුවෙන් විශාල සමාජමය වගකීමක් ඇතිවාක් මෙන්ම බැංකුව ගොඩනගා ඇති දිගුකාලීන සම්බන්ධතා උපරිම කිරීම සහ ගනුදෙනුකරුවන් තවදුරටත් බැංකුව වෙත රඳවා තබාගැනීමත් අත්‍යවශ්‍ය වේ. මෙබඳු තත්ත්වයකදී,
   (i) "සබඳතා අලෙවිකරණය (Relationship Marketing)" යන්නෙහි අර්ථය විස්තර කරන්න. *(ලකුණු 03 යි)*
   (ii) දැනට සිටින ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීම සඳහා "සබඳතා අලෙවිකරණය" යොදාගන්නා ආකාරය දක්වන්න. *(ලකුණු 07 යි)*

23. පහත සඳහන් කරුණු අතරින් ඕනෑම හතරක් සඳහා කෙටි සටහන් ලියන්න.
   (i) ආයතනික යහපාලනය (Corporate Governance)
   (ii) අතරමැදි පිරිවැය (Intermediation Cost)
   (iii) ටීකිව්එම් (TQM)
   (iv) අංකිත අත්සන (Digital Signature)
   (v) KIOSK බැංකුකරණය (KIOSK Banking)
   (vi) ආයතනික සංස්කෘතිය (Organizational Culture)

*(ලකුණු 10 යි)*

* * *

Department of Examinations Sri Lanka